නිබන්ධනය - 01

විෂයය - සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය - 8 ශ්‍රේණිය

සැලකිය යුතුයි:- පහත සඳහන් ක්‍රියාකාරකම් සහ සටහන් අදාල සටහන් පොතෙහිම සඳහන් කරන්න.

## සෞඛ්‍යවත් පාසල් පරිසරයක් ගොඩනගමු.

* සෞඛ්‍ය ප්‍රවර්ධනය යනු 'තමන් ගේ, තම පවුලේ හා ප්‍රජාවේ සෞඛ්‍යය තත්ත්වය නංවාලීම සඳහා ස්වයං හැකියා ඇති අය බවට බලවත්කරණය කිරීමයි.

* පාසල් සෞඛ්‍ය ප්‍රවර්ධනය යනු පාසල් දරුවන් හා පාසල් කාර්ය මණ්ඩලය ඇතුළු පාසල් ප්‍රජාවේ සෞඛ්‍ය ප්‍රවර්ධනය සඳහා පූර්ණ සංවිධාන ශක්තිය යොදවා ක්‍රියාත්මක වන පාසලකි.

ක්‍රියාකාරකම 1

I සෞඛ්‍යය ප්‍රවර්ධන උපාය මාර්ග සඳහන් කරන්න.

* නෛතික ලෙස හෝ ජනතාව මගින් හෝ සම්මත කර ගනු ලබූ හා සියලු දෙනාගේ එකඟතාව මත සම්මත කර ක්‍රියාත්මක කරන දේ ප්‍රතිපත්ති ලෙස හැඳින්වේ.

* ප්‍රතිපත්ති ගොඩනැගීමේදී සැලකිලිමත් විය යුතු කරුණු:-
  - සුවිශේෂ ලෙස බලපාන ගැටලුවක් / අවශ්‍යතාවයක් පැවතීම
  - එය විසඳීමේදී හැකියාව පැවතීම
  - නිශ්චිතව ළඟා වූ බව හඳුනාගත හැකි වීම
  - ඒ තුළින් ලැබිය හැකි ප්‍රතිලාභ තිබීම.

* ප්‍රතිපත්ති සකස් කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග.
  - S - Specific - සුවිශේෂ
  - M - Measurable - මැනිය හැකි
  - A - Achievable - ළඟා විය හැකි
  - R - Realistic - යථාවාදී
  - T - Time target - කාලය නිශ්චිත

* ක්‍රියාත්මක කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණු:-
  - පාර්ශවකරුවන් දැනුවත් කිරීම
  - වගකීම් පැවරීම
  - නියාමනය කිරීම හා ඇගයීම.

ක්‍රියාකාරකම 02

පහත මාතෘකා යටතේ සෞඛ්‍යයට හිතකර පාසල් පරිසරයක් ගොඩනැගීම සඳහා අවශ්‍යතාවයන් පිළිබඳ පෙළගස්වන්න.

I භෞතික පරිසරය - භෞතික වස්තු

II මනෝ සමාජීය පරිසරය - මානව සම්පත්

ක්‍රියාකාරකම 03

I සෞඛ්‍ය සේවා ප්‍රතිසංවිධානයෙන් පාසලට අත්වන වැදගත්කම පිළිබඳ සඳහන් කරන්න.

II පෙළපොතෙහි පිටු අංක 73 හි සඳහන් ක්‍රියාකාරකම කරන්න.

ක්‍රියාකාරකම 04

I පාසලේ සෞඛ්‍ය ප්‍රවර්ධනය කිරීම සඳහා, ඔබට කළ හැකි දේවල් ඇතුලත් කරමින් යෝජනාවලියක් සඳහන් කරන්න.